IBO

IB DIPLOMA PROGRAMME
PROGRAMME DU DIPLÔME DU BI
PROGRAMA DEL DIPLOMA DEL BI

22070268

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2**

Wednesday 16 May 2007 (morning)
Mercredi 16 mai 2007 (matin)
Miércoles 16 de mayo de 2007 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied. You may include in your answer a discussion of a Part 2 work of the same genre if relevant. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N’ouvrez pas cette épreuve avant d’y être autorisé(e).
- Traitez un seul sujet de composition. Vous devez baser votre réponse sur au moins deux des œuvres de la 3e partie que vous avez étudiées. Le cas échéant, vous pouvez inclure dans votre réponse une discussion sur une œuvre du même genre littéraire étudiée dans la 2e partie du programme. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la 3e partie n’obtiendront pas une note élevée.
- Vous n’êtes pas autorisé(e) à amener des exemplaires des œuvres que vous avez étudiées dans la salle d’examen.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta deberá basarse en al menos dos de las obras estudiadas en la Parte 3. Se podrán hacer comentarios sobre una obra de la Parte 2 del mismo género, si fuera necesario. Las respuestas que no incluyan una discusión sobre al menos dos obras de la Parte 3 no recibirán notas altas.
- No se permite traer a la sala de examen copias de las obras estudiadas.


© IBO 2007

පහත සඳහන් මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට අදාළ විය යුතු ය. අදාළ නම් 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියක් ගැන වුව ද පිළිතුරේ දී සාකච්ඡා කළ හැකිය. 3 වන කොටසින් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

## සම්භාව්‍ය සාහිත්‍යය

1 **එක්කෝ (අ)** **සමාජය යහමගට යොමු කරවීමට යෝග්‍ය වන කතා පුවත් සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවලට වැඩි වශයෙන්ම වස්තු විෂය කර ගැනීමේදී ඒවා කෙතරම් දුරට රස දැනවෙන සේ ඉදිරිපත් වී ඇද්ද? නිදසුන් සහිතව විමසන්න.**

**නැතහොත් (ආ)** **ඔබ හදාරා ඇති සම්භාව්‍ය සාහිත්‍ය කෘති අතුරෙන් දෙකක් තෝරාගෙන අවස්ථා හා චරිත නිරූපණය අතින් ඒවායේ දක්නට ලැබෙන විශේෂ සාහිත්‍යමය ලක්ෂණ පැහැදිලි කරන්න.**

## නාට්‍ය කලාව

2 **එක්කෝ (අ)** **"නාට්‍යයක් මගින් විය යුත්තේ කිසියම් පුවතක් සිදු වූ බව කීම නොව සිදු වූ ආකාරය ඉදිරිපත් කිරීමයි." ඔබ අධ්‍යයනය කළ නාට්‍ය දෙකක් ඇසුරු කරගනිමින් මෙය සනාථ කරන්න.**

**නැතහොත් (ආ)** **සාම්ප්‍රදායික කතා වස්තු උපයෝගී කරගනිමින් ඒවා නව දෘෂ්ටිකෝණවලින් ඉදිරිපත් කිරීමට සිංහල නාට්‍ය කරුවන් කොතෙක් දුරට සමත් වී ඇද්ද යන්න ඔබ හදාරා ඇති නාට්‍ය කෘතිවලින් නිදර්ශන ගෙන හැර දක්වමින් පැහැදිලි කරන්න.**

## නවකථාව

3 **එක්කෝ (අ)** **ඔබ හදාරා ඇති නවකථා දෙකක් ඇසුරු කර ගනිමින්, තත්කාලීන සමාජ පසුබිම නිරූපණයට කතුවරුන් දෙදෙනා යොමු වී ඇති ආකාරය හා එය කොතෙක් දුරට සාර්ථක වී ඇද්ද යන්න සන්සන්දනාත්මකව විමසන්න.**

**නැතහොත් (ආ)** **නවකථාවක් සාර්ථක සාහිත්‍ය නිර්මාණයක් වීමට එහි වස්තු විෂය, චරිත නිරූපණය හා රචනා ශෛලිය අතින් කවර සාර්ථක ලක්ෂණ අන්තර්ගත විය යුතුද යන්න ඔබ අධ්‍යයනය කර ඇති නවකථා දෙකක් උපයෝගී කරගනිමින් පැහැදිලි කරන්න.**

**කාව්‍යය**

4 **එක්කෝ** **(අ)** **"ලේඛකයකුගේ සිත තුළ පහළ වන ප්‍රබල සංකල්ප රූප කාව්‍ය නිර්මාණයකට නැගීමේදී එම නිර්මාණයේ සාර්ථකත්වය උදෙසා උපමා රූපක ආදියෙන් ඔපවත් වූ කාව්‍යමය භාෂාවක් යොදාගත යුතු වෙයි." ඔබ හදාරා ඇති කාව්‍ය ග්‍රන්ථ දෙකක් ඇසුරෙන් විමසන්න.**

**නැතහොත්** **(ආ)** **ඔබ හදාරා ඇති කවීන්ගේ නිර්මාණවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හඳුන්වා දෙමින් පාඨකයාගේ රස වින්දනයට ඒවා ඉවහල් වන ආකාරය අදාළ කාව්‍ය රචනා කිහිපයක් උපයෝගී කරගනිමින් විමර්ශනය කරන්න.**

**කෙටිකතා**

5 **එක්කෝ** **(අ)** **ලේඛකයකුගේ ජීවන අත්දැකීම්වලින් එක් අවස්ථාවක් විෂය කර ගනිමින් නිර්මාණය වන හෙයින්, "කෙටිකතාව ජීවිතයෙන් පෙත්තක් (A slice of life) විදහා දක්වන්නක්ය" යන කියමන, ඔබ හදාරා ඇති කෙටිකතා දෙකක් ආශ්‍රයෙන් සනාථ කරන්න.**

**නැතහොත්** **(ආ)** **ඔබ හදාරා ඇති කෙටිකතා අතුරෙන් වඩාත්ම ඔබ සිත් ගත් රචනා දෙකක දක්නට ලැබෙන, කෙටිකතා නම් සාහිත්‍ය අංගයට විශේෂ වූ වැදගත් සාහිත්‍යමය ලක්ෂණ පැහැදිලි කරන්න.**

**පොදු ප්‍රශ්න**

6 **එක්කෝ** **(අ)** **"සාහිත්‍යය මිනිසාගේ ජීවන යථාර්ථය පිළිබිඹු කරන්නක්ය" යන මතය කොතෙක් දුරට පිළිගත හැකිද යන්න ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් විමසන්න.**

**නැතහොත්** **(ආ)** **"හොඳ සාහිත්‍ය නිර්මාණයක්, එය රචනා වූ අවධියට පමණක් සීමා නොවන, සර්වකාලීන අගයකින් යුක්ත කෘතියක් විය යුතුය." ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.**

**නැතහොත්** **(ඇ)** **"සාහිත්‍ය කෘතියක අඩංගු වන චරිත හා සිදුවීම් පාඨකයා තුළ විශ්වාසයක් දනවන අතරම ඇතැම් විටක පාඨකයා පුදුමයට පත් කරවීමට ද ඉඩ ඇත." ඔබට මේ කියමනට එකඟ විය හැකිද?**

**නැතහොත්** **(ඈ)** **'සමාජය තුළ කාන්තාව මුහුණ දෙන දුෂ්කරතා, ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘතීන්හි කොතරම් දුරට ප්‍රබල ලෙස විග්‍රහයට ලක් වී ඇද්දැයි නිදසුන් සහිතව විමසන්න.**